# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


2013/12/26

**මාධ්‍ය නිවේදනයයි**

**දේශපාලන බල අරගලයට හසු වූ බදුරලිය රෝහල සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ස්ථාවරය**

බදුරලිය රෝහලේ වෛද්‍යවරු ඉන් ඉවත්විම සම්බන්ධව වැරදි අර්ථකථනයක් සිදුවී ඇති අතර ඊට සම්බන්ධව කතුවැකිද පක්ෂපාති ලෙස පලවී ඇත. සිද්ධිය සැකවින් මෙසේය.

රෝගියෙක් රැගෙන බදුරලිය රෝහලට බීමත්ව පැමිණි පිරිසක් රෝහලේ සේවකයන්ට පහරදී වෛද්‍යවරුන්ට මරණ තර්ජනය කිරීම නිසා අවාසනාවන්ත තත්ත්වය උද්ගත විය. දේශපාලන හයිය අතට ගෙන මෙසේ කලබල කරද්දිත් වෛද්‍යවරයා රෝගියාට අවශ්‍ය වූ පරිදි ප්‍රතිකාර කර කළුතර රෝහලට මාරු කර යවා ඇත. රෝගියාට හෘදයාබාධය වැලඳී මියගොස් ඇත්තේ ඊට දිනකට පසුවය. බදුරලිය රෝහලේ සේවාවල කිසිම අතපසුවීමක් සිදුවී නැත.

රෝගියාගේ මරණය පිලිබඳ ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් ගත හැකි වී තිබියදීත් නොයෙකුත් අක්‍රමවත් ක්‍රියාමාර්ග විවිධ දේශපාලන පක්ෂ පවතින මැතිවරණ උණුසුම හමුවේ ප්‍රසිද්ධිය ලබා ගැනීම සඳහා මාරුවෙන් මාරුවට කරගෙන යනු ලබයි. මුල් කලහාකාරී අවස්ථාවේදී පොලිසියේ ක්‍රියාකාරීත්වයද රෝහල් සේවකයින්ට ආරක්ෂාකාරී පරිසරයක් ඇති කිරීමට සමත් වූයේ නැත.

දේශපාලනයෙන් උමතු වී වෘත්තිකයන් දනගස්වන, ගස් බදින රටේ ගරු කල යුතු ආයතනයක් වන රජයේ රෝහලට දේශපාලන උන්මත්තකයින් පහරදීම අරුමයක් නොවේ. ලොවපුරා රෝහල්වල සේවකයින්ට සිදුවන අඩතේට්ටම් කිසිදු අයුරකින් ඒ රටවල බලධාරින් හෝ පොලිසිය අනුමත කරන්නේ නැත. නමුත් මතින් හා බලයෙන් උමතු වූ දේශපාලඥයින් මරණ තර්ජනය කරද්දි වෛද්‍යවරුන්ට සේවය කල නොහැක.

බඳගිරිය වෛද්‍යවරියද මීට සමාන තත්ත්වයක් අප සංගමයට පැමිණිලි කරද්දි බය නොවී ප්‍රතිකාර කරන ලෙස අපද උපදෙස් දෙන ලදී. ඊට සතියකට පසුව එම වෛද්‍යවරිය වෙඩිතබා මරා දැමීම නිසා අපට ඊට දැඩි පසුතැවීමකට හේතුවක් විය. එමෙන්ම මීට පෙර බදුරරිය රෝහලේම සේවය කල දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී පීටර් ප්‍රනාන්දු මහතාද පිහියෙන් ඇන ඝාතනයට ලක් කර ඇති බව සිහිපත් කරමු.

රෝහලක් යනු දේශපාලන බිමක් හෝ කලහාකාරි ස්ථානයක් නොවේ. රෝහල් සේවකයන්ට සුරක්ෂිත ලෙස සේවා සැලසීමට අවකාශය තිබිය යුතුය. මෙම රෝහලේ වෛද්‍යවරුන් තිදෙනා පත්වූ දින සිට රෝහලේ ප්‍රසූත කරන දරුවන් සංඛ්‍යාව මසකට 20 දක්වා වැඩි වී ඇත. බාහිර අංශයේ රෝගී ප්‍රතිකාර සේවා දිනකට රෝගින් 350 ඉක්මවා ගොස් ඇත. නේවාසික රෝගින්ද වැඩි වී ඇත. මෙම වෛද්‍යවරුන් තිදෙනා වසරක් ඇතුලත තුන් ගුණයකින් තරම රෝහල් සේවාව වැඩි කිරීමට දායක වී ඇත. ඉන් පැහැදිලිව පෙනෙනුයේ දුප්පත් ජනතාවගේ ප්‍රසාදය ඔවුන්ට හිමි වී ඇති බවයි.

දුර බැහැර ප්‍රදේශවල දිළිදු ජනතාවට රෝගී සත්කාරක සේවා මෙම මට්ටමෙන් රෝහල් පවත්වාගෙන යන්නේද ලංකාවේ පමණක් බව සියලු දෙනාම දැනගත යුතුය. ඕස්ට්‍රේලියාව වැනි රටවල දුර බැහැර ප්‍රදේශවල රෝහල් වැසී ගොස් ඇත. එබැවින් මාධ්‍ය මේ පිලිබද නිවැරදි වැටහිමකින් ප්‍රවෘත්ති පලකිරිම අප හුදෙක්ම අපේක්ෂා කරමු.

රෝහලක් පවත්වාගෙන යායුතු සුරක්ෂිත වටපිටාව පවත්වාගෙන යාමට වගකිව යුතු පිරිසක් වගකීම දරන්නේනම් හා එම පිරිස වෛද්‍යවරුන්ගේ ජීවිත ආරක්ෂාව පිලිබඳ වගකීම ගන්නේ නම් මෙම වෛද්‍යවරුන් තිදෙනා සේවයේ යෙදවීමට අප පසුබට වන්නේ නැත. මෙම වෛද්‍යවරුන්ගේ දෙමාපියන්ට හා දරුවන්ට ඔවුන්ගේ ජීවිත පිලිබදව සහතිකයක් දිමට අප බැඳී සිටිමු.

**මේ පිලිබඳව මාධ්‍ය සාකච්ජාවක් පැවැත්වීමට 2013/12/27 දින දහවල් 12.00 ට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගම් මුලස්ථානයේදි පැවැත්වීමට අප බලාපොරොත්තු වෙමු.**

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර :

| | |
|---|---|
| වෛද්‍ය නවීන් සොයිසා | - 0718582444 |
| වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |
| වෛද්‍ය තිමති වික්‍රමසේකර | - 0772003062 |